"අසන්නට නොව අරබන්නට..."

**"ගිහියා පැවිද්දා ගේ ඇද පලුදු සෙවීම"**

ගිහියාට සිල් පද පහකි. උපසම්පදා භික්ෂූන් වහන්සේ නමකට විනය ශික්ෂාපද 227 කි.

භික්ෂුවකගේ භික්ෂුත්වය අහිමි වන්නේ ඉන් බරපතල ම කාරණා සතර වන පාරාජිකා සතර කඩවීමෙනි. පාරාජිකා යනු පැරදුනා යන්නයි. භාග්‍යවතුන් වහන්සේ උපමාවකින් සඳහන් කරන්නේ ගල් පර්වතයක් මැදින් දෙකඩ වූ පසු නැවත එක් කළ නොහැක්කාක් මෙන් පාරාජිකාපත්තියට පැමිණි භික්ෂුවක් නැවත නිවැරදි කර ගත නොහැකි බවයි. භික්ෂුවකට නිවැරදි කර ගත නො හැකි වන්නේ ඒ සතර පමණි. ඉතිරි 223 න් කුමක් කඩ වුවද නිවැරදි කරගත හැකි අතර භික්ෂුත්වය අහිමි නොවේ. එහෙයින් තවදුරටත් ඒ තැනැත්තා භික්ෂුවකි.

සම්බුද්ධත්වයෙන් වසර විස්සක් යන තුරු විනය ශික්ෂාපද පැණවීමේ අවශ්‍යතාවයක් නොවුනේ ශ්‍රද්ධාවෙන් සසුන්ගත වූ කුලපුත්‍රයන් තම අරමුණ මූලික කොටගෙන සසුන් බඹසර රැක කල යුත්ත කොට අවසන් කළ හෙයිනි. ඉන් පසුව විනය පැණවීමේ අවශ්‍යතාවය මතු වූයේ ටිකින් ටික කෙළෙස් හරිත ව කටයුතු කල භික්ෂූන් ගේ මනා හික්මීම පිණිසම ය. බුද්ධ කාලයේදී ම එසේ නම් අද වැනි කාලයක කවර කථාද?

වර්තමාන බෞද්ධයෝ භික්ෂූන් වහන්සේලා ගේ යම් යම් කාරණාවන් මහත් කොට දක්වමින් ඒවා උලුප්පා විවේචනය කරමින් පහත් වූ රසයක් වින්දනය කරති. අසවල් හාමුදුරුවෝ මෙහෙම ය, අසවල් හාමුදුරුවෝ මෙසේ මෙසේ කළාය යි ලොවට හඬගා කියති. වසරකට එක් දිනක් දානයක් පූජා කොට දින 364 ක් විවේචනය කරති. මේ භික්ෂූන් ට නින්දා කිරීමේ ගිහියා ගේ ඇති ආශාව රේරුකානේ චන්දවිමල මහානායක ස්වාමීන් වහන්සේ ශාසනාවතරණය නම් වූ ග්‍රන්ථයෙහි මෙසේ දක්වා ඇතඃ

පැවිද්දන්ට ගර්හා කිරීම බැනීම ලෝකයෙහි එදත් අදත් කවදත් ඇතියකි. ලෝකයෙහි අසත්පුරුෂයෝ බොහෝ ය. ඔවුහු අනුන්ට ගර්හා කිරීමට - රිදවීමට ඉතා කැමැත්තෝ ය. ඔවුනට නිදහසේ බනින්නට ඇත්තා වූ එකම පිරිස පැවිදි පිරිස ය. එබැවින් ඔවුහු පැවිද්දන්ට බැණීම මහත් රුචියකින් කෙරෙති. පැවිද්දන්ට කවර ආකාරයකින්වත් ඉන් නිදහස් ව නො විසිය හැකි ය. ඖදාරික පැවතුම් ඇති පැවිද්දාට දුශ්ශීලයෙකැයි බණිති. සන්සුන් පැවතුම් ඇති පැවිද්දාට මෝඩයෙක - කුහකයෙක කියා බණිති. දුප්පත් පැවිද්දාට කාලකණ්ණියෙක - පච්චකාරයෙක කියා නින්දා කෙරෙති. සාමාන්‍ය පැවිද්දන්ට තබා දේවබ්‍රහ්මයන් පවා ගරු බුහුමන් වැඳුම් පිදුම් කරන බුදුරජාණන් වහන්සේට පවා බැණුමෙන් නිදහස් ව විසිය නො හැකි විය. (ශාසනාවතරණය පිටුව 167).

බුද්ධ ශාසනයක් පණවා වදාළ මහා කාරුණිකයාණන් වහන්සේ පවා පාරාජිකා සතර හැර අන්‍ය ආපත්තීන් ට පැමිණි භික්ෂූන් කැඳවා භික්ෂුව නුඹේ මහණකම මෙතැනින් අවසන් වේය යි කිසිදා දේශනා කොට නැත. මහත් වූ හෝ කුඩා වූ හෝ සිකපද රැකගෙන සසුන්ගත වූ අරමුණ කරා යාම ඒ ඒ පැවිද්දා සතු වගකීමකි.

උපසම්පදා ශීලයෙහි තරම පිළිබඳව රේරුකානේ චන්දවිමල මහානායක ස්වාමීන් වහන්සේ විසින් උපසම්පදා ශීලය නම් වූ ග්‍රන්ථයෙහි මෙසේ දක්වා ඇතඃ මේ උපසම්පදා ශීලය වනාහි ගිහියන් පොහෝ දිනයෙහි රකින අෂ්ටාංග ශීලය සේ සුළු ශීලයක් නො වේ. එක්දිනක් රකින ශීලය තනිපයින් සිට රැකිය යුත්තක් වුව ද එය රැකීම එතරම් දුෂ්කර නො වේ. එක සිකපදයක් වුව ද වර්ෂගණනක් හෝ දිවිහිමියෙන් හෝ රැකීම අති දුෂ්කර ය. භික්ෂූහු පාරාජිකා සිකපද සතර වූ මහාශීලය දිවිහිමියෙන් රකිති. එය සුළු කරුණක් නො ව මහ කරුණෙකි. බොහෝ ගණනක් ඇති සංඝාදිසේසාදී බුද්දානුබුද්දක සිකපද වලින් එකකුදු නො කඩවන පරිදි උපසම්පදා ශීලය පෘථග්ජන භික්ෂුවකට තබා සියලු කෙලෙසුන් නැසූ රහත් කෙනෙකුට වුව ද රැකීම දුෂ්කරය. යමෙක් පාරාජිකා සිකපද සතර වුව ද දීර්ඝකාලයක් රකින්නේ නම් ඔහු ශ්‍රේෂ්ඨ පුද්ගලයෙකි. වැඳුම් පිදුම් ලැබීමට සුදුස්සෙකි. (උපසම්පදා ශීලය පිටුව 25).

සිල්පද පහක් වත් රැකගත නොහැකි වර්තමාන ගිහියන් විනය සික පද 227 න් අඩුතරමින් කිසියම් ප්‍රමාණයක් රක්ෂා කරන්නා වූ භික්ෂුවගේ ඇද පලුදු සෙවීම තමන් ඇඳි වත ගලවා අනුන් ගේ කුණු පිස දමන්නට උත්සාහ කිරීම වැනි නිර්ලජ්ජිත ක්‍රියාවකි.

එහෙයින් කරුණු නුවණින් සලකා බලා සියළු සත්ත්වයෝ ලොවට අනුත්තර වූ පින් කෙතින් නිසි අස්වනු නෙලාගෙන බුද්ධ ශාසනය චිරාත් කාලයක් පවත්වා ගැනීමට ඒ තුලින් ම ඉඩ හසර සලසා ගනිත්වා.

මෙයට

ශාසනස්ථිතිකාමී - බණමඩුව